# ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ටාචාරය
# සහ
# එල්ලාංගා පද්ධති



ආචාර්ය රාජිකා අමරසිංහ
සහන් මල්සි ගුණවර්ධන

ශ්‍රී ලංකාව අතීතයේදී පෙරදිග ධාන්‍යාගාරය වැනි අන්වර්ථ නාම හා විරුදාවලීන්ගෙන් හඳුන්වන ලද අතර, එයට මූලිකව හේතුව වූයේ අප රටේ පැවති සෞභාග්‍යය, සශ්‍රීකත්වය හා මේ සියල්ල කැටිකොට ගත් කෘෂිකාර්මික දියුණුවයි. පෙර පැවති මෙම තත්ත්වයට අතීත ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුග්‍රහයෙන් සාදවන ලද මහා වැව් ප්‍රධානතම සාධකයක් වේ. ආහාර නිෂ්පාදනයට, මිනිසා, සතා සිව්පාවා, ගස් වැල් ඇතුළු මුළු මහත් පරිසරයේම පැවැත්මට අවැසි ජලය වර්ෂාව අඩු පෙදෙස් වලට පවා වසර පුරා නොඅඩුව ලැබුමට, ඒ අතීත සිංහලයා සතුව පැවතී වාරි තාක්ෂණික දැනුම, ද්‍රව ඉංජිනේරු විද්‍යාව හා ඒ ආශ්‍රිත හසල දැනුම උපයෝගී කර ගනිමින් වැසි ජලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමේ අරමුණින් සකසන ලද එල්ලංගා පද්ධතිවල (වැව් පොකුරු) දායකත්වය සුළුපටු නොවේ. වත්මනෙහි නූතන තාක්ෂණය පවා පරදවන මෙන්ම, ඒ හා සම්බන්ධ විද්වතුන් පවා මවිතයට පත් කරන එම නිර්මාණ අවාසනාවකට මෙන් ශ්‍රී ලංකාවේ වත්මන් පරපුරෙහි අවධානයට, නිසි අධ්‍යනයයන්ට හා විමසීම් වලට පවා ලක් නොවීම හේතුවෙන් දිනෙන් දින මෙම වැව් පද්ධති අභාවයට, අක්‍රීයත්වයට පත් වෙමින් ඇති අතර, එය රටේ නිෂ්පාදන ආර්ථික වර්ධනයේ අපගමනයටද හේතු වී ඇත. මෙම තත්ත්වයෙන් මුදා ගැනීමට ඇතැම් පිරිස් හා ආයතන ක්‍රියාත්මක වෙමින් සිටිනු දැකීම සතුටකි. වත්මන් දැනුම පිපාසිත, නූතන තාක්ෂණික දැනුම පමණක් මුල් කරගත් දරු පරපුරට, ශ්‍රී ලාංකික වාරි තාක්ෂණයේ ප්‍රෞඪත්වය දැන ගැනීමටත්, ඒ තුළින් ලද දායාද ආරක්ෂා කර ගැනීමට හා ඒ දැනුම උකහා ගනිමින් වත්මන් රටේ දියුණුවට දායක වීමටත් හැකිවීමට උපකාර වීමේ අරමුණින් රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ, පාංශු විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය රාජිකා අමරසිංහ මහත්මිය සහ එම විශ්වවිද්‍යාලයෙන්ම උපාධිය ලබාගත් මල්සි ගුණවර්ධන මෙනවිය විසින් ලියන ලද ''ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ටාචාරය සහ එල්ලංගා පද්ධති'' යන ග්‍රන්ථය ඉතාමත් කාලෝචිත ග්‍රන්ථයකි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ඩී. වන්නිආරච්චි**
පීඨාධිපති,
කෘෂිකර්ම පීඨය,
රුහුණ විශ්ව විද්‍යාලය,
මාපලාන,
කඹුරුපිටිය.

Price Rs.250/=
ISBN 978-624-5544-16-5
9 786245 544165

STAMFORD LAKE PUBLICATION